45 කිට

(82)

වගා සහනාධාර
චක්‍රලේඛ අංක:45

මගේ අංකය:සං/ව.ආ/ප්‍රති vi
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ.පෙ.1474,
කොළඹ 03.
1995ක්වූ ජූනි මස      වෙනි දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන්,
ස්ථානභාර නිලධාරී - අගලවත්ත/කළුතර

## තේ වගා අවසර පත්‍ර වෙනුවෙන් ක්‍රියා කිරීම.

අධිකාරිය විසින් ප්‍රාදේශීය කාර්යාල සහ ව්‍යාපෘති කාර්යාල මගින් එක් එක් වර්ෂවලදී නිකුත් කරන ලද අවසර පත්‍ර අතුරෙන් සැලකෙන කොටසක් කිසිදු ගෙවීමක් ලබා නොමැති අතර, තවත් කොටසක් වාරික එකක් හෝ කිහිපයක් ලබා ගැනීමෙන් අනතුරුව අක්‍රියව ඇත. මෙවැනි අවසර පත්‍ර වෙනුවෙන් විටින් විට මුදල් අවශ්‍යතාවයන් තීරණය කිරීම ඉතා අපහසු කාර්යයක් බවට පත්වී ඇති අතර, ඒ තුලින් මූල්‍ය අංශයේ කටයුතු සැලසුම්කට අනුව කරගෙන යාම අපහසු වී ඇත. මෙම අවසර පත්‍ර, <u>වලංගු කාලය ඉක්මවූ අවසර පත්‍ර හා වාරික ගෙවීම් 01 ක් හෝ කිහිපයක් ලබාගෙන ඇති අවසර පත්‍රය</u> කොටස් 02 කට බෙදෙන අතර ඒ පිළිබඳව පහත දැක්වෙන ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

1. <u>වලංගු කාලය ඉක්මවූ කිසිදු වාරිකයක් ලබාගෙන නොමැති අවසර පත්‍ර:</u>

මෙබඳු අවසර පත්‍ර වෙනුවෙන් ලියා පදිංචි තැපෑලෙන් එකී අවසර පත්‍රලාභීන් වෙත දැනුම්දීමක් කර අවසර පත්‍ර ක්‍රියාත්මක කිරීම හෝ අවලංගු කිරීම සඳහා කටයුතු කළ යුතුය. ප්‍රතිචාරයක් ලැබෙන අවසර පත්‍ර වෙනුවෙන් අවම ප්‍රමාණවත් කාලපරිච්ඡේදයක් දක්වා එක් වතාවක් පමණක් නැවත වලංගු කළ හැකි අතර, එසේ වලංගු කරනු ලබන අවසරපත්‍ර දැඩි අධීක්ෂණයකින් පවත්වාගත යුතුය. කාලසීමාව අවසානයේදී අක්‍රිය තත්ත්වයක පවතින්නේ නම්, වහාම අවලංගු කළ යුතුය.

2 <u>වලංගු කාලය ඉක්මවූ වාරික ගෙවීම් එකක් හෝ කිහිපයක් ලබාගෙන ඇති අවසරපත්‍ර:</u>

මෙවැනි අවසරපත්‍ර සම්බන්ධයෙන් ප්‍රාදේශීය /ව්‍යාපෘති කාර්යාල මගින් මෙයට අමුණා ඇති ආකෘතියට අනුව ලිපියක් ලියාපදිංචි තැපෑලෙන්, වාරික ගෙවීම් ලබාගත්, දැනට අක්‍රිය තත්ත්වයක පවතින අවසරපත්‍ර ලාභියා වෙත යොමු කළ යුතුය. එහි පිටපතක් ක්ෂේත්‍ර නිලධාරීන් මගින් ක්ෂේත්‍ර පරීක්ෂණ අවස්ථාවේදී අදාල පුද්ගලයින්ගේ අවධානය යොමු කිරීම සඳහා ලබා දිය යුතුය ඒ අනුව අක්‍රිය තත්ත්වයක පවතින අවසරපත්‍ර ක්‍රියාත්මක කිරීම උදෙසා කටයුතු කළ යුතුය. තවදුරටත් අක්‍රියව පවතින්නේ නම්, ගෙවීම් ආපසු ලබාගැනීමේ අවශ්‍යතාවය දැනුම්දී බලපත්‍ර අවලංගු කළ යුතුය.

ඉදිරි කටයුතු කිරීමට එකඟ වන අවසර පත්‍ර රෙගුලාසියෙන් අවම ප්‍රමාණයට කාලසීමාවක් ලබාදී එක් වතාවක් පමණක් නැවත වලංගු කළ යුතු අතර, දැඩි අධීක්ෂණයට යටත් කළ යුතුය. දීර්ඝ කළ කාලය තුළද ප්‍රගතියක් දක්නට නොමැති නම් ලබා ගත් මුදල් ආපසු ගෙවන ලෙස දැනුම්දීමක් නොව බලපත්‍රය අවලංගු කළ යුතුය.

3 <u>දැනට වලංගු අවසර පත්‍ර:</u>

දැනට වලංගු අවසර පත්‍ර එම වලංගු කාලය තුළ සියලු වගා වැඩ කටයුතු නිම කරවා ගැනීමට උත්සාහ දැරිය යුතු අතර, එහි පූර්ණ වගකීම අදාල ක්ෂේත්‍ර නිලධාරී වෙත පැවරේ. දැනටමත් උපදෙස් දී ඇති පරිදි මෙබඳු අවසර පත්‍ර මනා අධීක්ෂණයක් යටතේ පවත්වා ගත යුතුය. යම් හෙයකින් වගා කටයුතු නොකරන බවට වාර්තා වේ නම්, ඒවා අවලංගු කර එතෙක් ලබාගෙන ඇති මුදලක් වෙතොත් ආපසු අය කර ගැනීමට ක්‍රියා කළ යුතුය.

ඉහත සඳහන් කරන ලද පදනම මත ඔබ කාර්යාලයේ ක්‍රියාකාරී අවසරපත්‍රවල ලේඛණයක් එහි වර්තමාන වගා තත්ත්වය සහ කාලය ඉකුත් වන දිනය සහිතව සකස් කළ යුතු අතර, එහි පිටපත් අදාල උප කාර්යාල සහ ක්ෂේත්‍ර නිලධාරීන් වෙත බෙදා දීම මගින් ඔවුන් සියලුදෙනාම එය ඇගයීමකට ලක් කළ යුතුය. ක්‍රියාකාරී අවසර පත්‍රයක් එම අදාල කාලය තුළ වැඩ නිම කරවා ගැනීම, අදාල ක්ෂේත්‍ර නිලධාරීගේ වගකීම බව ඔවුන් වෙත ඒ සමග ලිඛිතව දැනුම් දිය යුතුය.

මෙම වැඩපිළිවෙල යටතේ ඉදිරියට අක්‍රිය අවසරපත්‍ර කිසිවක් ලේඛණගතව තබා ගත යුතු නැත. ඒ අනුව එක් එක් වර්ෂයේ/කන්නයේ ඔබ කාර්යාලයේ සහනාධාර මුදල් අවශ්‍යතාව පැහැදිලිව තීරණය කර ඒ අනුව ඉල්ලුම් කළ යුතුය. අධිකාරියේ සහනාධාර මුදල් අවශ්‍යතාවය/ප්‍රතිපාදනය තීරණය කරනු ලබන්නේද ඉහත ඔබ සපයන තොරතුරු මත බවද සැළකිය යුතුය.

## <u>විශේෂ උපදෙස්</u>

ඉහත අංක (2) සහ (3) යටතේ සඳහන් අවසරපත්‍ර ගෙවීම් එකක් හෝ කිහිපයක් ලබා ඇතිවිට අවලංගු කරනු ලබන අවස්ථාවේදී ඔබ අනුගමනය කරන ලද ක්‍රියා මාර්ගය සහිතව ලේඛණයක් ඒ පිළිබඳව දැඩි ලෙස කටයුතු කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයට යොමු කළ යුතුය.

## <u>අවසර පත්‍ර නිකුත් කිරීම සහ සහනාධාර වාරික ලබාදීම:</u>

සහනාධාර මුදල් ලබා දෙනු ලබන්නේ තේ වගාවේ උන්නතිය සඳහා දැනට තේ වගා කරනු ලබන්නාගේ දායකත්වයෙන් පිහිටා ඇති සේ අනුකූලවයි.

එවන් අරමුදලකින් වාරික ලබාගෙන ව්‍යාපෘතිවල නොයෙදුන්නේ නම් හෝ ව්‍යාපෘති අසාර්ථක කරනා ඇත්නම් එය ජාතික අපරාධයක් සහ වංචා ක්‍රියාවක් ලෙසට හඳුනාගත යුතුව ඇත. එමෙන්ම එවන් පුද්ගලයින් හට කිසිම සහනාධාර මුදලක් ලබා නොදීමේ සහ දණ්ඩමය නීති සංග්‍රහය යටතේ දඬුවම් ලබා දිය හැකි වරදක් ලෙසද ඉදිරියේදී හඳුන්වනු ඇත.

ක්‍රියාකාරී අවංක ජස ජනසවියට හිතැති පුද්ගලයින් හඳුනාගැනීම ජස පරීක්ෂක/ව්‍යාපෘති නිලධාරීන්ගේ වගකීමක් වන අතර, ජස පරීක්ෂක/ව්‍යාපෘති නිලධාරීන්ගේ සේවය ඇගයීමේදී අඛණ්ඩ අවසර පත්‍ර ප්‍රමාණයද මින් ඉදිරියේදී සැලකිල්ලට ගනු ඇත.

මෙම චක්‍රලේඛය ලද බවත්, ඒ අනුව ක්‍රියා කරන බවත් නොපමාව මා වෙත සනාථ කළ යුතුය.

සභාපති.

පිටපත්:

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යා)
2. කළමනාකරු (ව්‍යාපෘති)
3. සියලුම අධීක්ෂක ජස පරීක්ෂක/ව්‍යාපෘති නිලධාරීන්.
4. සියලුම ජස පරීක්ෂක/ව්‍යාපෘති නිලධාරීන්

ඝ-66

වගා සහනාධාර චක්‍රලේඛ අංක 45

දෙවන ගෙවීම සඳහා ඇමුණුම.

........................ප්‍රා/කාර්යාලය

........................................

........................................

අවසර පත්‍ර අංකය:

1995 ........................දින.

ප්‍රිය මහත්මයාණෙනි / මහත්මියනි,

## අවසර පත්‍රය යටතේ තේ වගා කටයුතු නොපමාව නිමකරන මෙන් දැනුම්දීම

ඔබ විසින් ලබාගෙන ඇති ඉහත අංකය දරණ තේ වගා අවසර පත්‍රය යටතේ තේ පැල සිටුවා අවසන් කිරීමට ඉඩදී ඇති කාලසීමාව දැනටමත් ඉකුත්ව ඇති බව දන්වනු කැමැත්තෙමි. තවද මේ සම්බන්ධයෙන් ඔබ මෙම අධිකාරියෙන් සහනාධාර මුදලක් ලබාගෙන ඇතොත් ඉන් පසුව කිසිදු වාරික මුදලක් ලබාගැනීමට ඉදිරිපත් නොවීමෙන් පෙනී යන්නේ ඔබගේ වගා කටයුතු අතරමග නවතා දමා ඇති බවයි.

දැනට වලංගු කාලය අවසන්ව අක්‍රිය තත්ත්වයේ ඇති ඔබගේ අවසර පත්‍රය යටතේ තේ වගා කටයුතු ඉතාමත්ම ඉක්මණින් නිමකර වර්ෂයක කාලයක් ඇතුලත ඉතිරි සියලුම ගෙවීම් ලබාගැනීමට කටයුතු කරන ලෙස ඔබට තරයේම දන්වා සිටිමි. මෙහිදී තේ පැල සපයාගැනීම, ඉතිරි මුදල් සපයා ගැනීම වැනි යම් අපහසුතාවයක් ඔබට ඇත්නම් ඒ පිළිබඳව ඔබ ප්‍රදේශයේ තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී මගින් හෝ කෙලින්ම මා වෙත ලිඛිතව දන්වන ලෙස කාරුණිකව ඉල්ලා සිටින අතර, ඒ සඳහා අධිකාරිය මගින් කිසියම් සහනයක් සැලසීමට හැකිද යන්න සොයා බලා ක්‍රියා පියවරක් ගැනීමට අපේක්ෂා කරමි.

ඉහත කාලය තුළ ඔබ එකී ගෙවීම් ලබාගැනීමට ඉදිරිපත් නොවන්නේ නම් හෝ අවසර පත්‍රය යටතේ වගා කටයුතු නිම කිරීමට අපේක්ෂා නොකරන්නේ නම්, දැනටමත් ඔබ ලබාගෙන ඇති සහනාධාර මුදල මෙහි සඳහන් දිනයේ සිට මාස තුනක කාලයක් තුළ මෙම අධිකාරියට සම්පූර්ණයෙන්ම ආපසු ගෙවා රිසිට් පතක් ලබාගන්නා ලෙස ඔබට දන්වා සිටිමි.

යම් හෙයකින් ඔබ එම කාලය ඇතුලත එකී මුදල ආපසු ගෙවීමට අපොහොසත් වුවහොත් 1975 අංක 35 දරණ සුළු තේ වතු සංවර්ධන පනත යටතේ ගැසට් පත්‍ර මාර්ගයෙන් කලින් කල ප්‍රකාශයට පත් කරන ලද තේ වගා සහනාධාර නියෝග යටතේ ඔබට එරෙහිව නීති මගින් කටයුතු කර එකී මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව මෙයින් දැනුම් දෙමි.

මේ සම්බන්ධයෙන් කිසියම් අපහසුතාවයක් ඔබට ඇති නොවීම පිණිස මෙම ලිපිය කෙරේ දැඩි අවධානයක් යොමු කරන මෙන්ද, මෙම කරුණ සම්බන්ධයෙන් ඔබ අනුගමනය කරන ක්‍රියා මාර්ගය මාසයක කාලයක් ඇතුලත මා වෙත දැනුම් දෙන මෙන්ද කාරුණිකව දන්වා සිටිමි. එම කාලය තුළ ඔබගෙන් කිසිදු පිළිතුරක් නොලැබුණහොත් ඉහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම නොවැලැක්විය හැකි බැව්ද දන්වා සිටිමි.

ප්‍රාදේශීය කළමනාකරු.

පිටපත :-

තේ පරීක්ෂක/ ව්‍යාප්ති නිලධාරී

........................

k-sd-rm